**ශ්‍රම වාසනා අරමුදල - 2017**

**-----------------------------------**

ශ්‍රම වාසනා අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1998 අංක 12 දරන ශ්‍රම වාසනා අරමුදල් පනතේ 12(4) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කලමනාකරණයේ වගකීම

**-------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරණ මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

**2.** **මූල්‍ය ප්‍රකාශන**

**2.1** **තත්වාගණනය කළ මතය**

මෙම වාර්ථාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රම වාසනා අරමුදලේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2.** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1** **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ)** **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01**

සමාලෝචිත වර්ෂය අවසානයේ අරමුදල සතුව පැවති රු.මිලියන 103 ක් වන ස්ථාවර තැන්පතු කල් පිරීමේ කාලය මාස 12 ක් හෝ ඊට අඩු කාලසීමාවක් වුවත් ප්‍රමිත 01 හි 76 ඡේදයට පටහැනිව එම ආයෝජන ජංගම නොවන වත්කම් ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි දක්වා තිබුණි.

**(ආ)** **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත - 02**

2017 වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ, අනෙකුත් ලැබීම්වල වැඩි වීම රු.28,488,838 ක් ලෙස පෙන්විය යුතු වුවත් රු.33,552,553 ක් ලෙස දැක්වීම හේතුවෙන් රු.5,063,715 ක් වැඩියෙන් සටහන් කර තිබුණි.

**(ආ)** **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත - 07**

ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 926,125 ක් වූ වත්කම් අයිතම 14 ක් සම්පූර්ණයෙන් ක්ෂය ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

**(ඇ)** **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත - 08**

ප්‍රමිතයේ 22 ඡේදය ප්‍රකාරව ප්‍රතිපාදනයක් ලෙස හඳුනා ගැනීමට සපුරාලිය යුතු කොන්දේසි සපුරා නොතිබියදී 2017 වර්ෂයේ අරමුදල් විසින් ඉටුකල යුතු සුභසාධන වැඩසටහන්, නීති ආධාර ලබාදීම ශිෂ්‍යත්ව ලබාදීමේ වැඩසටහන් 03 ක් සඳහා රු. 5,924,524 ක වෙන් කිරීම් කර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි.

**2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

-------------------------

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුල ඇතුළත් රු.33,000 ක්වූ අස්පෘශ්‍ය වත්කම් ලෙස හදුනාගත් වත්කම එහි ඵලදායී ජීවකාලය තුල ක්‍රමක්ෂය කර නොතිබුණි.

**2.2.3 ගිණුම්කරණ අඩුපාඩු**

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුලදී දරන ලද රු.225,490 ක කාර්යය මණ්ඩල වියදම්, වියදම් යටතේ ගිණුම්ගත කිරීම වෙනුවට ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණි. එම නිසා අරමුදලේ වාර්ෂික අතිරික්තය සහ ජංගම නොවන වත්කම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් නිරූපනය කර තිබුණි.

(ආ) අරමුදල විසින් භාවිතයට ගනු ලබන වත්කම් අයිතම 06 ක සමාලෝචිත වර්ෂයට අදාල ක්ෂය ප්‍රමාණය රු. 25,839 කින් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඇ) අරමුදල සඳහා 2018- 2022 යන වර්ෂ 05 කාල සීමාව සඳහා සංයුක්ත සැලැස්ම සකස් කිරීම වෙනුවෙන් දරන ලද රු.295,175 ක වියදම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ වියදමක් ලෙස හඳුනා ගැනීම වෙනුවට ජංගම නොවන වත්කම් යටතේ පර්යේෂණ හා සංවර්ධන වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

**2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

----------------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| **නීති, රීති, රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** |
| --- | --- |
| (අ) මුදල් රෙගුලාසි 237 (ඇ) | නුවරඑළිය දිස්ත්‍රික්කයේ පවත්වන ලද අක්ෂි සායනය වෙනුවෙන් ලබාගත් අත්තිකාරම් පියවීමට අදාළ නවාතැන් පහසුකම් වෙනුවෙන් පෞද්ගලික ආයතනයකට ගෙවූ රු.12,000 ක් වෙනුවෙන් මුදල් ගෙවූ බවට කුවිතාන්සි ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) 1998 අංක 12 දරන ශ්‍රම වාසනා අරමුදල් පනතේ 7(2)1 උප වගන්තිය (අ) සහ 13(2) උප වගන්තිය | "ශ්‍රම වාසනා" යනුවෙන් ලොතරැයියක් පැවැත්වීමට කටයුතු කලයුතු වුවත් එලෙස ඉටු නොකිරීම හා ඒ වෙනුවට "ජාතික සම්පත" යනුවෙන් ලොතරැයියක් පැවැත්වීම |

**3.** **මූල්‍ය සමාලෝචනය**

**3.1** **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.13,155,579 අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.28,264,114 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.15,108,535ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට වර්ෂයේ ලොතරැයි ආදායම රු.19,062,791 කින් පහළ යෑම සහ පරිපාලන වියදම් රු.3,657,555 කින් ඉහළ යාම ද අරමුදලේ අරමුණු සඳහා දරන ලද වියදම් රු. 89,155 කින් පහළ යාම ද ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේදී රු.57,537,862 ක් වූ අරමුදලේ අතිරික්තය 2017 වර්ෂය වන විට රු. 13,155,579 ක් දක්වා අඛණ්ඩව පිරිහී තිබුණි. කෙසේ නමුත් මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වන ක්ෂය නැවත ගැලපීමේදී 2013 වර්ෂයේදී රු.59,973,904 ක් වූ දායකත්වය සමාලෝචිත වර්ෂය වනවිට එය රු. 24,416,576 ක් දක්වා අඛණ්ඩව පිරිහී තිබුණි.

**4.** **මෙහෙයුම් සමාලෝචනය**

**4.1** **කාර්යසාධනය**

**4.1.1** **සැලැසුම් කිරීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ)** අරමුදල විසින් 2013 – 2017 කාලසීමාවට අදාලව පිළියෙල කර තිබූ සංයුක්ත සැලැස්මෙහි එක් එක් සුභසාධන වැඩසටහන සම්බන්ධව ප්‍රතිලාභීන් හඳුනාගැනීම පිළිබඳ නිශ්චිත අදහසක් අරමුදල සතුව නොතිබීම ප්‍රධාන දුර්වලතාවයක් ලෙස සඳහන් කර තිබුණි. එම දුර්වලතාව අවම කර ගැනීමට අරමුදල උපායමාර්ග ගෙන නොතිබීම හේතුවෙන් 2018 – 2022 කාලසිමාව සඳහා සකස් කල සංයුක්ත සැළැස්ම තුළද එකී දුර්වලතාවය තවදුරටත් පවතින බව සඳහන් කර තිබුණි. 1998 අංක 12 දරණ අරමුදල් පනතේ 6 (අ) වගන්තියේ සඳහන් අරමුණ පෘථුල ලෙස සඳහන්ව පැවතීම ප්‍රතිලාභීන් තෝරාගැනීම පිළිබඳ ගැටලු පැවතීමට මූලික හේතුවක් ලෙස නිරීක්ෂණය විය.

**(ආ)** අරමුදල විසින් 2013 – 2017 කාලසීමාවට අදාලව සකස් කල සංයුක්ත සැළැස්ම තුල සේවා නියුක්තිකයන්ට සුභසාධනය සැලසීමට සූදානම් රාජ්‍ය නොවන සංවිධාන විශාල ප්‍රමාණයක් පැවතීම අරමුදලට අවස්ථාවක් (Opportunity) ලෙස එම විශ්ලේෂණය තුල දක්වා තිබුණ ද කාලසීමාව තුල අරමුදල විසින් එකී අවස්ථාවන් ප්‍රයෝජනය ගැනීම සඳහා රාජ්‍ය නොවන ආයතන සමඟ සම්බන්ධීකරණයක් ගොඩනගා ගැනීම සඳහා උපායමාර්ග හඳුනාගෙන නොතිබුණි.

**4.1.2** **ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය**

සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව වූ අරමුණු ඉටුකර ගැනීමට අදාලව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දැනුවත් කිරීමේ වැඩසටහන් 28 ක් රු. මිලියන 1.5 ක වියදමකින් පැවැත්වීමට සැලසුම් කළද, ඉන් පිරිවැය රු.900,000ක් වූ වැඩසටහන් 06 ක් පවත්වා නොතිබුණි. එය වෙන් කරන ලද මුදලින් සියයට 60 ක් විය.

(ආ) වෘත්තිය අනතුරු ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ රු.මිලියන 7 ක ප්‍රතිපාදන මත ශිෂ්‍යත්වලාභීන් 100 දෙනෙකු සඳහා ප්‍රතිලාභ ලබාදීමට සැලසුම් කර තිබුණද රු.මිලියන 4.6 ක් වැයකර ප්‍රතිලාභීන් 74 දෙනෙකු සඳහා වැඩසටහන් පවත්වා තිබූ අතර වර්ෂය අවසානයේදී රු.මිලියන 2.4 ක් ඉතිරිව පැවතුණි.

(ඇ) රු.මිලියන 2.5 ක් විශේෂ සේවයක් කරන ලද තැනැත්තන්ට ත්‍යාග පිරිනැමීම සඳහා වෙන්කර තිබුණද එම වැඩසටහන පවත්වා නොතිබුණි. එහෙත් විගණනයට ඉදිරිපත් කළ ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය පෙන්වන වාර්තාවේ සේවායෝජකයන් 33 ක් සඳහා රු.මිලියන 0.29 ක් වැය කර තිබූ බව දක්වා තිබුණි.

(ඈ) 2013 – 2017 වර්ෂ සඳහා අරමුදල පිළියෙල කර තිබූ සංයුක්ත සැලැස්මේ 4.3.1 යටතේ සුභසාධන වැඩසටහන් දිවයින පුරා ආවරණය වන පරිදි සමාන අවස්ථා ලබාදිය යුතු බවට දක්වා තිබුණි. ක්‍රියාකාරී සැලැස්මේ සමාලෝචිත වර්ෂය තුල වැඩසටහන් 10 ක් පැවැත්වීමට සැලැසුම් කර වැඩසටහන් 30 ක් පවත්වා තිබුණ ද ඉන් වැඩසටහන් 10 ක්ම රත්නපුර සහ බදුල්ල දිස්ත්‍රික්ක සඳහා පවත්වා තිබුණි.

(ඉ) 2017 වර්ෂය සඳහා අරමුදල විසින් සකස් කළ ක්‍රියාකාරී සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂය තුල කෘතිම අත් හා පාද 42 ක් බෙදා දීමට සැලසුම්කර තිබුණද තෝරාගත් ලැයිස්තුවෙන් පරිබාහිරව එක් පුද්ගලයෙකුට පමණක් විශේෂයක් කර කෘතිම පාදයක් ලබාදී තිබුණි. එමෙන්ම 2016 වර්ෂයේදී තෝරාගත් 14 දෙනා සඳහා කෘතිම අත් පා ලබාදීමත් සමාලෝචිත වර්ෂය අවසන් වන තුරුද සිදුකර නොතිබුණි.

**4.2** **අරමුදල් ඌන උපයෝජනය**

**-------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ)** සමාලෝචිත වර්ෂය සඳහා රු. මිලියන 80 ක් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් ලබා දී තිබුණද අරමුදලේ අරමුණු ඉෂ්ඨ කරගැනීම වෙනුවෙන් සිදු කළ වැඩසටහන් සඳහා එම මුදල් සැලසුම්ගතව යොමුකර නොතිබුණු බැවින් ලබාදෙන ලද ප්‍රතිපාදනවලින් රු. මිලියන 51 ක් එනම් සමාලෝචිත වර්ෂයේ ලද මුදලින් සියයට 64 ක් ම අදාල අරමුණු ඉටු නොකර රාජ්‍ය බැංකුවල ස්ථාවර තැන්පතු ලෙස ආයෝජනය කර තිබුණි. මෙලෙස සමාලෝචිත වර්ෂය අවසන් වනවිට පැවති ආයෝජනවල වටිනාකම රු.මිලියන 103 ක් විය. මීට අමතරව අරමුදල වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසන් වනවිට භාණ්ඩාගාර තැන්පතු යටතේ පැවති මුදල රු.මිලියන 290 ක් විය.

**(ආ)** 2017 වර්ෂයේ පැවැත්වීමට සැලසුම් කළ වැඩසටහන් සඳහා මූල්‍ය තත්ත්ව විස්තරයේ රු.5,924,524 ක් ප්‍රතිපාදනය කර තිබුණි. 2018 වර්ෂයේදී එම වෙන් කළ මුදලින් සියයට 21 ක පමණ මුදලක් 2018 වර්ෂයේ විගණිත දිනය වන විට වැඩසටහන් වෙනුවෙන් වැය කර තිබුණි. ඒ අතුරින් ද වැඩසටහන් පැවැත්වීමට භාණ්ඩ මිලට ගැනීම පමණක් සිදු කර තිබුණු බව නිරීක්ෂණය වූ අතර, අරමුදල විසින් නිසි කළමනාකාරීත්වයකින් තොරව වැඩසටහන් සැලසුම් කිරීම හා එම සැලසුම් ක්‍රියාත්මක කරලීමේ අකාර්යක්ෂමතාවයක් විගණනයේදී නිරීක්ෂණය විය.

**4.3 ඌන උපයෝජිත වත්කම්**

2016 වර්ෂයෙහි රු. 364,781 කට මිලදීගෙන තිබූ රූපවාහිනී යන්ත්‍ර 03 ක් අරමුදලේ අරමුණු ප්‍රචාරය කිරීමේ අරමුණින් කම්කරු මහලේකම් කාර්යාල පරිශ්‍රයේ පිවිසුම් ස්ථානයේ සවිකර තිබූ රූපවාහිනී යන්ත්‍රයක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ප්‍රයෝජනයට නොගෙන පැවතිණි.

**4.4 කාර්යය මණ්ඩල පරිපාලනය**

සමාලෝචිත වර්ෂය අවසානයේදී අරමුදලේ අනුමත කාර්ය මණ්ඩලය 18 ක් වූ අතර, ඉන් සහකාර කළමනාකාර තනතුරු 02 ක් සඳහා පුරප්පාඩු පැවතිණි. ආයතනය එම පුරප්පාඩු පිරවීම සඳහා පියවර ගෙන නොතිබුණි.

**5. තිරසාර සංවර්ධනය**

**5.1 තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟා කරගැනීම**

2017 අගෝස්තු 14 දිනැති අංක ND/SP/SDG/17 දරණ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද ලිපිය හා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 " න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කල යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව අරමුදල විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි.

**6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**6.1 අභ්‍යන්තර විගණනය**

(අ) කළමනාකරණ හා විගණන දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කර ඇති 2009 ජුනි 09 දිනැති අංක DMA/2009 (01) දරන විගණන හා කළමනාකරණ චක්‍රලේඛයේ 09 ඡේදය ප්‍රකාරව සෑම කාර්තුවක් අවසානයේම අභ්‍යන්තර විගණන වාර්තා නිකුත් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසාන වන විට එක් වාර්තාවක් පමණක් නිකුත් කර තිබුණි.

(ආ) අරමුදල විසින් 2017 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන සැලැස්මක් ඉහත චක්‍රලේඛ ආකෘතිය ප්‍රකාරව සකස් කර තිබුණ ද පද්ධති විශ්ලේෂණය, කාර්යසාධන ඇගයීම සහ විශේෂ විමර්ශන සිදුකිරීම පිළිබඳ නිශ්චිත කරුණු අන්තර්ගත වී නොතිබුණි.

**6.2 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය**

**6.2.1 ප්‍රසම්පාදනයන්**

ප්‍රසම්පාදන මාර්ගෝප සංග්‍රහයේ 4.2 ප්‍රකාරව අරමුදලේ ප්‍රසම්පාදන සැලැස්ම 2017 වර්ෂය සඳහා සකස්කර තිබුණද අරමුදලේ අරමුණු ඉටුකර ගැනීම සඳහා කලයුතු වැඩසටහන් වලට අදාල රු.9,882,474 ක ද්‍රව්‍ය මිලදී ගැනීම පිළිබඳ විස්තර ප්‍රසම්පාදන සැලැස්ම තුල අඩංගු වී නොතිබුණි.

## 6.3 නොවිසඳී ඇති විගණන ඡේද

---

අරමුදලට අදාලව 2016 විගණකාධිපති වාර්තාවේ 2.2.5 යටතේ ඇතුලත්ව තිබුණු පහත සඳහන් විගණන ඡේද සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු නිමකර නොතිබුණි.

(අ) එක් එක් වර්ෂයේ දී පවත්වනු ලැබිය යුතු ලොතරැයි සංඛ්‍යාව හා ලොතරැයි වර්ග පිළිබඳ එකඟතාවයක් ශ්‍රම වාසනා අරමුදල සහ ලොතරැයි මණ්ඩලය අතර ඇති වී නොතිබීම.

(ආ) ප්‍රදානය කරනු ලබන තෑගි පිළිබඳව සහ හිමිකම් කියා නොසිටින තෑගි සම්බන්ධයෙන් කටයුතු කෙරෙන ආකාරය පිළිබඳව ලොතරැයි මණ්ඩලය හා අරමුදල අතර එකඟතා ඇති කරගත යුතු වුව ද එලෙස කටයුතු කර නොතිබීම.

(ඇ) ලොතරැයිය මගින් ලැබෙන මුදල් ප්‍රදානය කරනු ලබන තෑගි වටිනාකම හා ලොතරැයිය පැවැත්වීමේ වියදම වශයෙන් ලොතරැයි මණ්ඩලය හා අරමුදල අතර එකඟවන ප්‍රමාණය සම්බන්ධයෙන් වන එකඟතාවය.

## 07. පද්ධති හා පාලනයන්

---

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| **(අ)** ප්‍රසම්පාදන ක්‍රියාවලිය | • තාක්ෂණ ඇගයීම් කමිටු සඳහා විෂය පිළිබඳ විශේෂඥයන් සහභාගි කරවා නොගැනීම.<br>• ලංසු විවෘත කිරීමේ කමිටු සාමාජිකයන් ලංසු විවෘත කිරීම පිළිබඳ වාර්තා අත්සන් කර නොතිබීම.<br>• ලංසු ඇගයීමේදී ලංසු කැඳවීම් ලේඛනවල සඳහන් නොවූ නිර්ණායක පදනම් කරගෙන තිබීම. |
| **(ආ)** අරමුදලේ අරමුණු සඳහා දරන ලද වියදම් පාලනය | • ප්‍රතිලාභීන් තෝරාගැනීම සඳහා නිශ්චිත නිර්ණායක භාවිතා කර නොතිබීම.<br>• තෝරාගත් ප්‍රතිලාභීන් පිළිබඳ වගකිව යුතු නිලධාරීන් සහතික කරන ලද ලැයිස්තු අරමුදල සතුව නොතිබීම.<br>• තෙවන පාර්ශවයන් වෙත ලබාදුන් භාණ්ඩ තෝරාගත් ප්‍රතිලාභීන් වෙත ලබාදුන් බවට සනාථන ලබා නොගැනීම හා පසුවිපරම් නොකිරීම. |